# බක් මහේ සයවන වසරට පා තබන සන්නස කුමරියට

රත් පැහැ ගත් මලින් බර වු එරබදු ගස් කාගේත් නෙත් පිනවයි. කොහාගේ -කොහෝ . කොහෝ.... නාදය සැමතින්ම සවනේ පතිත වෙයි. කාගෙ කාගේත් ගෙවල රන්වන් කෙසෙල් කැන් එල්ලී තිබේ. රත්වුන තෙල් තාච්චි වලින් කැවුම් කොකිස් බදිනා සුවඳ මදනල සමඟ මුසු වී චිත් නැහැය සිසාරා යයි. කමතෙන් ගෙට වැඩි අලුත් කැකුළු සහල්ද කිරි බතක් වන්නට පුන පුනා බලා සිටියි. මේ අප මව් බිමේ බක් මහ සිරියයි. අවුරුදු කුමරා පිලිගන්නට සැවොම සැරසෙති.

මෙල්බනයේද එසේමැයි. සිංහල අවුරුදු සමරණ කොයි කාගේත් සිත් සතන් පිබිදී ඇත. හැකි අය තමන්ගේම නිවසේ කැවුම්, කොකිස්, අතිරහ වැනි රස කැවිලි සාදන අතර නොහැක්කෝ අවුරුදු මේසය සැරසීමට ශ්‍රී ලංකික වෙලඳ සැල්වලින් ඒ ඒ දෑ මිලයට ගනිති. නක්ෂත්‍රය අනුව රටට සරිලනයේ වේලාවන් සකසා ඇති හෙයින් ක්‍රියා පටිපාටියද ඔව්හු අකුරටම අනුගමනය කරති.

අවුරුදු ක්‍රීඩාවන්ද මෙනුවර ඉහලින්ම සිදුවේ. ඉපැරණි කෙලි සෙල්ලම් හා අලුතින් එකතුවු ක්‍රීඩාද, තරඟයෙන්ද මේ උත්සවයේ තැන ගනී. දරු දැරියන්ද, තරුණ තරුණියන්ද, වැඩි මහල්ලන්ද එකමුතුවී එකසේ විනෝද වෙති. ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික ජනතාව වැඩි වශයෙන් සිටින මෙල්බනයේ මෙවැනි උත්සවයක් ඉතා උත්කර්ෂවත් ලෙස පවත්වාගෙන යෑමට කවුරු කවුරුත් අත හිත දෙති. ගුවන් විදුලි සේවාවන්ද, අපේම අපේ පුවත් පත්ද මේ ගැන ප්‍රචාරය කරන්නේ කල් ඇතුවමය.

අවුරුදු කුමරා සමඟ අතිනත ගෙන එන තවත් රුවැත්තියකි සය වසරකට පෙර මෙල්බන් පුරවරින් බිහිවුනු මේ සුරූපිකාව සන්නස කුමරියයි. මනුලොව සිය වසරක් දෙව් ලොව එක් වසරකි. ඇය දෙව්ලොවින් මිහි බට දෙවඟනක මෙන් සහ වසරකට ඤාන නුවණ ඇත්තියකි.

ඇය අන්තර්ජාලයෙන් මනුලොව සැරි සරන්නීය. ගුණ සුවඳ මෙපමණයැයි කිව නොහැකිය. සතර දෙදිගේ විසිර ඇති වියක් ගත් කරුවන්ගේ නිර්මාන ඇයගේ ඇතුළු පිටු සරසයි. එමෙන්ම ආධුනිකයන් හට අත දීමෙන් ඔවුන් තම තමන්ගේ සාහිත්‍ය ක්ශේත්‍රයේ මුදුන් හිනි පෙත්තට නංවා ලීමට ඇය වෙහෙස දරයි. ළමා ලපටින් දිරිමත් කරයි.

සන්නස කුමරියේ, තිරය පසුපස සිටිමින් ඔබහට මේ කර්තව්‍යය සඳහා සහාය දෙන සාහිත්‍ය වේදින් රැසකි. ඔබ වෙත ලඟා වන ගද්‍ය පද්‍ය ඡායා - රූ සුදුසු ලෙස සකසා පිටු සරසන්නට වෙහෙස දරණ පිරිසකි. ඒ ඒ අදාල කාර්යයන්හි නිපුණතාව ඇත්තන් ස්වේච්චාවෙන්ම තම තමන්ගේ අගනා කාලය යොදවා මසකට වරක් ඔබ සරසා දොරට වඩම්මති. එසැමට මෙන්න පාඨක අපෙන් තුති පුද.

ඔබ සැමට ඒ සඳහා තව තවත් දිරි ලැබේවා. සන්නස කුමරිය රැක ගැනීම කැන්ගරූ දේශයේ වසන ශ්‍රී ලාංකික අප සැමගේම යුතුකමකි. මේ බක් මහේ සය වසරට පා තබන ඔබට ශුභ උපන් දිනයක් සන්නස කුමරියනි.

ලක්ෂ්මි ගුණරත්න




# LIBERAL PARTY WANTS INDIAN SUBCONTINENT BORN VICTORIAN MP OUT OF PARLIAMENT



Last week, the member for South Eastern Region Inga Peulich said the Sri Lankan born and only Indian Subcontinent born Member of Parliament in Australia should retire and for the people to elect a better Member of Parliament.

This statement was made by Ms Inga Peulich on the 24th March 2011 in response to the contribution made by Mr. Perera on the Police Services Amendment (Protective Services Officers) Bill 2010.

Speaking on the Bill Mr Perera said

" The bill allows the government to appoint an additional 940 protective services officers on train stations. These 940 PSOs are to be stationed on metropolitan railway stations and at rail hubs in major regional centres from 6.00 p.m. until the last train, seven days a week. However, the Premier committed to having PSOs on every station in Victoria at the last election. It was an election commitment and it is the public expectation, but it now turns out to be a broken promise. "

We can understand politician doctoring spins. That is exactly what Ms Peulich was trying to do by implying Jude Perera was concerned with country Victoria and not his electorate of Cranbourne. Ms Peulich was doctoring a spin to avoid scrutineer of her government's broken promise. We have no problem with spin doctoring.

However, Ms Peulich has no business to suggest Mr. Perera should retire. The constituents of the Cranboune electorate elected him twice with increasing majorities and again a third time in November of last year - he survived although his party had lost Government.

Really, shouldn't it be up to Mr Perera if he should retire or not?

This behaviour of Ms Peulich is absolute appalling. Will she goes around and call that every Labor MP retires when they are critical of the government and their broken promises? Why isolate the Sri Lankan born and only Indian sub-continent born Member of any parliament in Australia? In my view, this attack is of personnel nature.

Jude Perera is not only the only Sri Lankan born but also the only Indian subcontinent born person who was so far elected to any Lower House of parliament in Australia. He, along with few other overseas born members of the Victorian Parliament showcase the diversity of Victoria.

Does our Premier, Mr. Bailleau approve this type of personnel attack? If not he should take action. This is one of his Parliamentary Secretaries.

If Mr. Bailleau's does not take action against Ms Peulich, this would definitely confirm that he is also an opportunist, who will only work with the Victorian Indian sub-continent communities in general and Indian community in particular to find his way into Government and now that he is the Premier of this state, does not care whether a member of his Government or any of his colleagues brings down people born in the Indian sub-continent.

Sarath Dalpathadu

## සංවේගයෙන් දන්වමු



**සන්නස සංස්කාරක මණ්ඩලයේ සිසිර දිසානායක (ප්‍රවීණ ගීත රචක සහ ඕස්ට්‍රේලියාවෙ වික්රෝඩිස් ආයතනයේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු ) සොයුරා ගේ ආදරණීය මෑණියන් වූ එච් කේ කරුණා සාදිමැණිකේ මාතාවගේ අභාවය පිළිබඳ අපේ කණගාටුව මෙසේ පුද කරමු. දේහය පිළිබඳ අවසන් කටයුතු අප්‍රේල් 7 වන දා අවිස්සාවේල් පොදු සුසාන භූමියේදී සිදුකෙරෙයි. ශ්‍රී ලංකාවේ දුරකතන අංක 94 36 2222566 ඔස්සේ සිසිර ඇමතිය හැකි ය.**

**සන්නස**